# ෆෙයාෆස්ට් වාණිජ රථවාහන රක්ෂණය



fairfirst
INSURANCE
A FAIRFAX Company

0112 428 428 www.fairfirst.lk Fairfirst Insurance

# ආයුබෝවන්!

## ෆෙයාෆස්ට් වාණිජ රථවාහන රක්ෂණාවරණයට

### ඔබ සාදරයෙන් පිළිගනිමු!

ඔබගේ වාහනය ඔබගේ වටිනාම වත්කම් වලින් එකකි. ෆෙයාෆස්ට් හිදී, වාණිජ වාහන සඳහා අපගේ උසස් වු රක්ෂණ විසඳුම සමඟින් ඔබට කරදරවලින් තොරවූ සේවාවක් සහ ඉක්මන් හිමිකම් පියවීමක් සහතික කරන්නෙමු. සාමාන්‍යයෙන් මෙවැනි වාණිජ රථවාහන රක්ෂණ සැලසුමක ප්‍රධාන ලක්ෂණ වන්නේ, ඉතාමත් ඉක්මනින් හිමිකම් මුදල් ගෙවීම, පහසුවෙන් ගනුදෙනු කළ හැකි වීම සහ විශිෂ්ට පාරිභෝගික සේවාවක් ලබාදීම යනාදියයි. ඔබත් අපේක්ෂා කරන්නේ මෙවැනි ලක්ෂණ සහිත වාණිජ රථවාහන රක්ෂණයක් නම්, ඔබට හොඳින්ම ගැළපෙන්නේ ෆෙයාෆස්ට් වාණිජ රථවාහන රක්ෂණයයි.

- Click2Claim (C2C) නිසා හිමිකම් මුදල් ඉල්ලීමේදී ඔබේ කාලයත් ශ්‍රමයත් ඉතිරි වේ. Click2Claim යනු ෆෙයාෆස්ට් සමාගම හඳුන්වා දී ඇති සම්මානලාභී හිමිකම් මුදල් ගෙවීමේ සේවාවකි. එමගින්, හදිසි අනතුරක් වාර්තා කර විනාඩි 5 ක් තරම් කෙටි කාලයක් තුළ හිමිකම් මුදල් ගෙවීම් සිදුකළ හැක.

- රක්ෂණය මිලදී ගැනීමට ක්‍රම රැසක්! ඔබට අවශ්‍ය නම් අපගේ වෙබ් අඩවිය ඔස්සේ පමණක් නොව WhatsApp ඔස්සේ පවා අප වෙතින් රථවාහන රක්ෂණ මිලදීගත හැකි වේ. නැතිනම් සාම්ප්‍රදායික ක්‍රමයට, අපගේ නියෝජිතයෙකු වෙතින් හෝ දිවයින පුරා පිහිටි අපගේ ශාඛා 58 අතරින් ඔබට කැමති ශාඛාවකින් ඔබට අවශ්‍ය රක්ෂණය මිලදී ගතහැක.

- දුරකථනය තුන්වරක් නාද වීමට පෙර ඔබේ ඇමතුමට පිළිතුරු ලබාදෙන බවට අපි පොරොන්දු වන්නෙමු. අපගේ සුහදශීලි කාර්ය මණ්ඩලය, ඔවුන් වෙත යොමුවන ගැටලු අතරින් 85% ක්ම පළමු ඇමතුමෙන්ම විසඳීමට සමත් වෙති.

- Brand Finance මගින් ලැයිස්තුගත කර LMD මගින් ප්‍රකාශයට පත්කරනු ලබන Brands Annual ලැයිස්තුවේ 2022 සංස්කරණය අනුව අප මෙරට වඩාත්ම ආදරය දිනූ සාමාන්‍ය රක්ෂණ සන්නාමයන් තුන අතරින් එකක් වන අතර, 2023 පෙබරවාරි මාසය වන විට ඉහළම Facebook Ratings මට්ටම (4.1/5) අප වෙත හිමි වී තිබිණි.

සමස්තයක් වශයෙන් ගත් කල, අප සමඟ ඔබේ ගමන ආරම්භ කිරීම ඉක්මන් හා සරල විය යුතු බව අපි විශ්වාස කරන්නෙමු. එමෙන්ම, සාධාරණත්වය යනු අප සෑම විටම මුල්තැන දෙන ගුණාංගයක් බවත් අපි අවධාරණය කරමු.

fairfirst INSURANCE
A FAIRFAX Company





## අපගේ ගුණාංග සහ හර පද්ධතිය සංකේතවත් කරන FairfirstWay

**ඔබේ දියුණුවේ ගමනට මුල්‍ය රැකවරණය සලසන විශේෂඥයන්:** වසර 30 කට අධික කාලය තුළ අපි ශ්‍රී ලංකාවේ රථවාහන මිලියන 13.5 කට අධික සංඛ්‍යාවක් වෙනුවෙන් රක්ෂණ සේවාවන් පිරිනමා ඇත්තෙමු. මේ දක්වා අප හිමිකම් මුදල් වශයෙන් ගෙවා ඇති මුදල රු. බිලියන 15 ඉක්මවයි.

**සදා මතකයේ රැඳෙන විශිෂ්ට සේවාවක්:** සෑම විටම අපගේ සුහදශීලී කාර්ය මණ්ඩලය, දුරකථනය තුන්වරකට වඩා නාද වීමට පෙර ඔබේ ඇමතුම්වලට පිළිතුරු ලබාදෙයි. ගනුදෙනුකරුවන්ගේ ගැටලු අතරින් 85% ක්ම ප්‍රථම ඇමතුම තුළින්ම විසඳීමට අපට හැකි වී ඇත.

**ශ්‍රී ලාංකිකයින්ට සිතේ සහනය:** අපගේ සම්මානලාභී Click2Claim සේවාව භාවිතා කිරීමේදී, වීඩියෝ ඇමතුමක් හරහා විනාඩි 5ක් වැනි කෙටි කාලයක් ඇතුළත හිමිකම් මුදල් ඉල්ලීම් පියවීම සිදුකෙරේ. Click2Claim නිසා වඩාත්ම දුෂ්කර කාලසීමාවන් තුළ වුවත්, පැයකට ඉල්ලීම් 2,500 කට වැඩි සංඛ්‍යාවක් ඉටුකිරීමට අපට හැකි වී ඇත.

**අපි අර්ථවත් නවෝත්පාදන කෙරෙහි විශ්වාසය තබන්නේමු:** වටිනාකම්වලට මුල්තැන දෙන්නෙමු. ඔබේ වාහනයට පරිපූර්ණ ෆෙයාෆස්ට් රැකවරණය හිමි වී තිබීම, නිසැකවම ඔබේ සිතට ඉමහත් සැහැල්ලුවක් ගෙනෙනු ඇත.

fairfirst
INSURANCE
A FAIRFAX Company






# C2C Click2Claim

ෆෙයාෆස්ට් වෙතින් පමණක්ම හිමිවන, කෘත්‍රිම බුද්ධි තාක්ෂණයෙන් බලගැන්වෙන හිමිකම් මුදල් ගෙවීමේ සේවාව, ඔබේ හිමිකම් මුදල් ඉල්ලීම් විනාඩි 5ක් වැනි කෙටි කාලයක් තුළ ඉටුකරයි.

C2C යනු වීඩියෝ ඇමතුම් ඔස්සේ හිමිකම් මුදල් ඉල්ලීමේ ක්‍රියාවලිය සිදුකිරීමට අවස්ථාව සලසා දෙන සේවාවකි. එය ඔබේ ස්මාර්ට් දුරකථනය භාවිතයෙන් දුරස්ථ ක්‍රමයට හදිසි අනතුරු හානි තක්සේරු කිරීමට අවස්ථාව සලසා දෙයි. ඔබ කළ යුත්තේ, වීඩියෝ ඇමතුම ලබාගෙන, හානිය සිදු වී ඇති ස්ථානයට කැමරාව යොමුකිරීම පමණි. එවිට ෆෙයාෆස්ට් තාක්ෂණික තක්සේරුකරුවෙකු  අවශ්‍ය ඡායාරූප ලබාගෙන, හානිය තක්සේරු කරනු ඇත. මෙම නවීන ක්‍රමවේදය නිසා අපට ඕනෑම ස්ථානයක සිට ඔබ සමග දුරස්ථව සම්බන්ධ වී, සිදු වී ඇති හානිය සහ අනෙකුත් අවශ්‍ය තොරතුරු ලබාගෙන, විසඳුමක් යෝජනා කළ හැකි වේ. එම විසඳුමට ඔබ එකඟ වන්නේ නම් විනාඩි ගණනක් ඇතුළත අදාළ හිමිකම් මුදල ඔබට ලැබෙනු ඇත.



fairfirst INSURANCE
A FAIRFAX Company

## Cashless ක්‍රමයට අලුත්වැඩියා කිරීමේ සේවාව

ෆෙයාෆස්ට් සමග අත්වැල් බැඳගෙන සිටින, දිවයින පුරා විසිරුණු A ශ්‍රේණියේ රථවාහන නඩත්තු ස්ථානවලින්, මුදල් ගෙවීමකින් තොරව (Cashless ක්‍රමයට), අලුත්වැඩියාවන් සහ අමතර කොටස් සඳහා වසරක වගකීමක් සහිතව ඔබේ වාහනය අලුත්වැඩියා කර ගැනීමේ හැකියාව.

## අනතුර සිදුවූ ස්ථානයේදී තක්සේරුව සිදුකිරීම

ඔබට අවශ්‍ය නම්, අනතුර සිදු වු ස්ථානයේදී අපගේ රථවාහන ඉංජිනේරුවෙකු ලවා හානිය තක්සේරු කරවාගත හැකි වේ.

# අමතර ප්‍රතිලාභ

**01**

හදිසි අනතුරකින් පසුව පාවිච්චි නොකළ අමතර කොටස් යෙදීමේදි වසර තුනක් දක්වා අඩුකිරීමක් සිදුනොවේ. එම ආවරණය වාරිකයකට යටත් වේ (නියෝජිත ආයතන හරහා සිදුකරනු ලබන අලුත් වැඩියාවන් සඳහා)

**02**

අතිරේක පුළුල් ආවරණයන් අමතර වාරිකයකට යටත්ව,

**03**

වාහනය සඳහා ලීසිං හෝ ණය පහසුකම් ලබාගෙන ඇති අවස්ථාවකදී අතිරේක ගාස්තුවක් අය නොකෙරේ.

**04**

අපගේ මෙහෙවර හිමිකම් මුදල් ගෙවීමට සීමා නොවන අතර, ඔබට අවශ්‍ය නම් තාක්ෂණික සහයද ලබාගත හැක.

*ප්‍රතිලාභ, බැහැර කිරීම්, නියමයන් හා කොන්දේසි සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න. නැතිනම් විස්තර සඳහා 0112 428 428 අංකයෙන් ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න..



fairfirst INSURANCE
A FAIRFAX Company

# මෙම ප්‍රතිපත්තිය හරහා ආවරණය නොවන දෑ

හදිසි අනතුර සිදුවන අවස්ථාවට පෙර සිට පැවති බවට තාක්ෂණික නිළධාරී විසින් හඳුනාගනු ලබන හානි*.

අනතුරක් සිදු වූ වහාම රක්ෂණ සමාගම වෙත දැනුම් නොදුන් හානි.

ධාවන තරඟ, ප්‍රදර්ශනාත්මක ඉසව්, වේගය මැනීමේ තරග වැනි දේවල් සඳහා යොදාගනු ලබන වාහන සහ පෞද්ගලික භාවිතය හැර වෙනත් අරමුණු සඳහා යොදාගනු ලබන වාහන.

වාහනයට අනෙකුත් හානි සිදුවන අවස්ථාවේදීම හානිය සිදු නොවුයේ නම්, ටයර් සහ ටියුබ් වලට සිදුවන හානි ආවර්ණය 50% කට සීමා වේ.

වාහනයේ වටිනාකම් අඩු වීම,  කොටස් ගෙවී යාම, කාර්මික, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික දෝෂ, බිඳවැටීම්, කැඩී යාම් හෝ වෙනත් බැහැර කිරීම්*.

සොරුන් විසින් ගෙවල් බිඳීමකදී වාහනය සම්පූර්ණයෙන් සොරා නොගෙන, එහි අමතර කොටස් සහ උපාංග පමණක් සොරකම් කල අවස්ථාවක.

*ප්‍රතිලාභ, බැහැර කිරීමේ නියමයන් සහ කොන්දේසි සඳහා ප්‍රතිපත්ති ලේඛනය බලන්න හෝ වැඩි විස්තර සඳහා අපගේ ඇමතුම් මධ්‍යස්ථානය 0112 428 428 අමතන්න.



fairfirst
INSURANCE
A FAIRFAX Company



වාහනයක් තමන් සන්තකයේ තිබීම මෙන්ම එය නඩත්තු කිරීමද විශාල වගකීමකි. එම වගකීම තුළින් ඔබට පැවරෙන බර අවම කිරීම සඳහා අපි ඉතාමත් කාර්යක්ෂම හිමිකම් මුදල් ක්‍රමවේදයක් සහ ප්‍රතිලාභ රාශියක් හඳුන්වා දී ඇත්තෙමු. මෙම ආවර්ණය පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීමට කැමති නම්, ඔබට අවශ්‍ය ඕනෑම මොහොතක

## 0112 428 428

අංකය අමතන්න.

ඉහත දක්වා ඇත්තේ අප ලබාදෙන සේවාවන් සහ පහසුකම්වල සංක්ෂිප්ත විස්තරයක් පමණී. මේ සියල්ල, ඔබ තෝරාගන්නා රක්ෂණාවරණයට සහ සමාගමට අදාළ නියමයන් හා කොන්දේසි වලට යටත් වේ. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබ සමග සාකච්ඡා කිරීමට අපි සූදානමින් සිටින්නෙමු.

ප්‍රතිපත්ති ලේඛනයන් යනු: රක්ෂණ ආවරණ පත්‍රය, රක්ෂණ ඔප්පුව, රක්ෂණ සහතිකය, රක්ෂණ උපලේඛනය, අනුමත කිරීම්, බැහැර කිරීම්, අලුත් කිරිමේ දැන්වීම් යනාදියයි.

fairfirst INSURANCE
A FAIRFAX Company